**දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල -2016**

**-------------------------------------------------------------**

දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**---------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට දිවි නැගුම නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 2,369,568 ක් වූ පරිගණක උපාංග සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරිමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

අරමුදලේ ගිණුම් ප්‍රතිපත්ති අනුව ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කරන බව හෙළිදරවු කර ඇතත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පෞද්ගලික ආයතන 3 කට ගෙවිය යුතු එකතුව රු. 502,955 ක් උපචිත වියදම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 876(3) ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වාගෙනයාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කලයුතු බව දක්වා ඇතත්, අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු නොකර කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද රෙගුලාසිමාලාවක් අනුව සමාලෝචිත වර්ෂය දක්වා කටයුතු පවත්වාගෙන යමින් පැවතුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 447,187,633 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 42,450,354 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.404,737,279 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ප්‍රතිලාභීන්ගෙන් අයකරනු ලබන මාසික දායක මුදල රු. 15 සිට රු. 50 දක්වා වැඩි කිරීම හේතුවෙන් දායක මුදල් ආදායම රු. 677,960,370 කින් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්යසාධනය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 සහ 2015 වර්ෂවලදි දිනුම් අදින ලද සංඛ්‍යාවෙන් තාවකාලිකව අත්හිටවූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිලිවෙළින් 14 ක් සහ 23 ක් වූ අතර එම වර්ෂවලදි අවලංගු කල ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිලිවෙළින් 32 ක් සහ 47 ක් විය. තවද 2016 වර්ෂය තුලදි දිනුම් අදිනලද ලොතරැයි දිනුම් 2,400 කින් දිනුම් 183 ක් එනම් රු. 36,600,000 ක් විවිධ හේතු මත අදාල දිස්ත්‍රික් කාර්යාලවලින් හරවා එවා තිබුණි. ඒ අනුව ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීමක් සිදු කර නොතිබුණි.

(ආ) 2016 ජනවාරි 12 දින පැවති භාරකාර මණ්ඩල පත්‍රිකා DL/03/17 අනුව ලක්ෂ 14 ක ප්‍රතිලාභීන්ගෙන් ලැබෙන දායක මුදලින් සියයට 57.14 ක් ත්‍යාග දීමනා ගෙවීමට තීරණය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ දායක මුදල රු 853,416,530 ක් වූ අතර ගෙවා ඇති හා ගෙවිය යුතු දායක මුදල රු 457,000,000 ක් වීමෙන් ත්‍යාග දීමනා සියයට 53.54 ක අගයක් ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය ප්‍රතිලාභීන් සංඛ්‍යාව 17,077,822 ක් වූ අතර එම ප්‍රතිලාභීන්ගෙන් වර්ෂය තුළ හිමිකම් ලැබූ ත්‍යාගලාභීන් සංඛ්‍යාව 2400 ක් හෙවත් සියයට 0.014 ක් විය. මේ හේතුවෙන් සෑම ප්‍රතිලාභියෙකු සඳහාම නිවසක් යන්න අරමුදලේ දැක්ම හා පරමාර්ථ ලඟා කර ගැනීමට අවශ්‍ය කටයුතු සකස් කර නොතිබුණි.

(ඇ) අරමුදලේ රෙගුලාසි මාලාව අනුව ජයග්‍රාහී ප්‍රතිලාභීන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා සුදුසු ව්‍යාපෘතිවලට යොමු කිරීම අරමුදලේ පරමාර්ථයක් වුවද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 ජනවාරි 12 දිනැති භාරකාර මණ්ඩල රැස්වීම් වාර්තාව අනුව වර්ෂය තුලදි ලොතරැයි දිනුම් ඇදිය යුතු නිශ්චිත දින සඳහන් කර තිබූ අතරම දිනුම් අදිනු ලැබූ ත්‍යාග මුදල් අප්‍රමාදීව සමෘද්ධි දිස්ත්‍රික් කාර්යාලවලට යැවිය යුතු බවත් සඳහන්කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ දී ලොතරැයි දිනුම් ඇදීම සෑමවිටම මාසයකට වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණු අතර, ත්‍යාග මුදල් දිස්ත්‍රික් කාර්යාල වෙත යැවීම දින 27 ක සිට දින 60 ක කාලයක් ප්‍රමාද වී තිබුණි.

(ආ) 2011 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 58 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ගෙවීම සඳහා රු. 5,000 ක දීමනාවක් අනුමත කර තිබුණි. එසේ වුවද, එම චක්‍රලේඛයම පදනම් කරගෙන ව්‍යවස්ථාපිත නොවන අරමුදලේ සාමාජිකයන් සඳහා රු. 5,000 ක දීමනාවක් ගෙවීම සඳහා භාරකාර මණ්ඩලය විසින් 2016 පෙබරවාරි 23 දිනැති මාණ්ඩලික පත්‍රිකා DL/03/19 මගින් තීරණය කර සමාලෝචිත වර්ෂය සඳහා රු. 310,000 ක් ගෙවා තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ආයෝජන 20 ක මුළු ආයෝජන වටිනාකම වූ රු. 814,409,190 ක් මාස 06 ක් බැගින් වූ කෙටිකාලීන අයෝජනවල ආයෝජනය කර තිබීමෙන් දිගුකාලීනව ආයෝජනය කර ලබාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි.

(ඇ) එක්වරක් දිනුම් ලබාගත් ප්‍රතිලාභීන් නැවත දිනුම් ඇදීම සඳහා නිශ්චිත කාලපරිච්ඡේදයකට නවතා තැබීමේ ක්‍රමවේදයක් වශයෙන් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා දත්ත පද්ධතිය තුළින් ප්‍රතිලාභීන්ගේ නම් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 7 ක සමෘද්ධිලාභීන්ගේ නාම ලේඛනයෙන් ඉවත්කරනලද සමෘද්ධිලාභීන් 10 කු සඳහා 2014 සිට 2016 වර්ෂවල ත්‍යාගලාභීන් ලෙස තේරීපත් වී තිබුණි. ඒ අනුව සමෘද්ධිලාභීන්ගේ නාම ලේඛනය යාවත්කාලීන නොවීම පිළිබඳව තහවුරු වන අතර මෙම හේතුවෙන් වාර්ෂිකව ප්‍රතිලාභ ලබාදීමේ සංඛ්‍යාව අඩුවීමේ අවදානමක් පවතී.

(ඊ) 2014 සහ 2015 වර්ෂ සඳහා නිවාස ලොතරැයි දිනුම් ඇදීම 2016 ජනවාරි 18 දින විෂයභාර ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකර තිබූ අතර ඒ සඳහා රු. 787,242 ක් වියදම් කර තිබුණි. දිස්ත්‍රික් මට්ටමින් උත්සව පවත්වා එම ත්‍යාගලාභීන්ට චෙක්පත් ලබාදීම සඳහා එක් දිස්ත්‍රික්කයකට රු. 20,000 බැගින් ලබාදීමට භාරකාර මණ්ඩලය තීරණය කර දිස්ත්‍රික්ක 3 ක් සඳහා රු. 54,700 ක් ගෙවීම් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2021 ජුලි 14 දින දීය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර අරමුදල ව්‍යවස්ථාපිත කර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම තුළින් කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුයි.